- APSIM ආකෘතිය භාවිතා කරමින් සෙවනගල වර්ෂා පෝෂිත උක් වගාවේ උක් අස්වැන්න සහ සීනි ප්‍රතිසාධනය ආකෘතිකරණය කිරීම පිළිබඳව කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ උපාධි අපේක්ෂක ඊ.ජී. දුමිත් වානක විසින් සිදු කළ ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම.
- ශ්‍රී ලංකාවේ උක් වගා කරන පසෙහි ජලය රඳවා ගැනීමේ ධාරිතාව වැඩි කිරීම සඳහා උක් බැගෑස් ජෛව අඟුරුවල විභවය තක්සේරු කිරීම පිළිබඳව කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ උපාධි අපේක්ෂක W.P.D.තිලකරත්න විසින් සිදු කළ ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම.
- පැල්වත්ත ප්‍රදේශයේ උක් වගාවන්වල වර්ෂාපතන රටා විශ්ලේෂණය කිරීම පිළිබඳව ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂක කේ.පී. සෙව්වන්දි විසින් සිදු කළ ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම.

බෝග පෝෂණ අංශය - 2024

කාර්ය මණ්ඩලය

බී.ආර්. කුලසේකර මයා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	**කාර්ය භාර පර්යේෂණ නිලධාරී**
යූ.ඩබ්.එල්.එම්. කුමාරසිරි මයා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	**පර්යේෂණ නිලධාරී**
ජී.එස්. උඩවත්ත මයා	-	**තාක්ෂණ නිලධාරී**
ඩබ්.ඒ.එස්. විජේසූරිය මිය (කෘෂි විද්‍යාවේදී)	-	**තාක්ෂණ නිලධාරී**
ජේ. ගුණසිරි මයා	-	**විද්‍යාගාර/ක්ෂේත්‍ර උපස්ථායක**
පී.ඩබ්. ඩී. කුලතුංග මයා	-	**විද්‍යාගාර/ක්ෂේත්‍ර උපස්ථායක**

විශේෂ ජයග්‍රහණයන්

පර්යේෂණ

- සෙවනගල උක් වගා භූමිවල වගා කළමනාකරණ කලාප නිර්ණය කිරීම සඳහා උක් අස්වනු හා පාංශු තත්ව සඳහා වූ ජී අයි එස් (GIS) සිතියම් සකස් කිරීම.
- සෙවනගල උක් වගා ක්ෂේත්‍රවල ස්ථානීය පොහොර නිර්දේශයන් ලබා දීමට අදාළ පර්යේෂණ වගා ස්ථාපිත කිරීම සඳහා සුදුසු භූමියක් හඳුනාගැනීම.
- කාබණික ශාක පෝෂක භාවිතයෙන් උක් වගා කිරීමට අදාළව සිදුකරනු ලබන පර්යේෂණ වගාවේ දෙවනි නිරි වගාවේ දත්ත ලබා ගැනීම,විශ්ලේෂණය හා වගා පාලන කටයුතු සිදු කිරීම.
- උක් කර්මාන්තයේ දී අතුරු ඵලයක් ලෙස නිපදවනු ලබන බොයිලේරු අළු (Boiler Ash) භාවිතා කරමින් නයිට්‍රජන් වලින් පොහොසත් (3.5% දක්වා) කාබන් පොහොර කැටිති නිපදවීම හා එහි තත්ව පරීක්ෂාවට අදාළ මූලික අධ්‍යනයන් අවසන් කිරීම.
- උක් වගාවන් සඳහා යොදන විවිධ පොහොර භාවිතයෙන් උක් වගාවට හා පසට සිදුවන දීර්ඝකාලීන බලපෑම අධ්‍යනය කිරීම සඳහා එස් එල් 96 128 හා සී ඕ 775 උක් ප්‍රභේද භාවිතා කරමින් පර්යේෂණ වගාවක් ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම.
- ඇතිමලේ, වත්තේගම උක් තවාන් වගා භූමි සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි පාංශු සාම්පල සමීක්ෂණයක් සිදු කිරීම හා එහි මූලික පාංශු විශ්ලේෂණයන් අවසන් කිරීම.
- ගල් ඔය උක් කර්මාන්ත වගා භූමි වන ගල්මඩුව, වරිපතන්චේන කලාප සම්පූර්ණයෙන් ආවර්ණය වන පරිදි පාංශු සාම්පල සමීක්ෂණයක් සිදු කිරීම.

සේවාවන්

- සීනි කර්මාන්තයේ පර්යේෂණයන් හා උක් කර්මාන්තශාලා අවශ්‍යතාවයන් වලට අදාළ උක් දඬු/පත්‍ර/පාංශු/උක් හකුරු සාම්පල සඳහා රසායනාගාර විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.
- ලංකා සීනි සමාගමේ පැල්වත්ත ඒකකයට අදාළ උක් කර්මාන්තශාලාවේ ගිනි තබා අස්වනු නෙලන ලද උක් දඬු සම්බන්ධයෙන් ඇතිවූ ගැටළු සඳහා නිර්දේශයන් ලබා දීම.
- ලංකා සීනි සමාගමේ පැල්වත්ත ඒකකයේ කාබණික උක් වගාවන් සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම.
- කාබණික තත්වයන් යටතේ නිෂ්පාදනය කළ සීනි ආනයනය අවශ්‍යතාවයන්ට අදාළ තාක්ෂණික මගපෙන්වීම ලබාදීම.
- දෙශීය උක් කර්මාන්තයේ වගාවන් සඳහා සංයුක්ත පොහොරවල බලපෑම පරීක්ෂා කිරීමට අදාළ වන තාක්ෂණික මගපෙන්වීම හා සහාය ලබාදීම.

- ලංකා සීනි සමාගමේ සෙවනගල ඒකකය සඳහා පොහොර සාම්පල රසායනාගාර විශ්ලේෂණ සේවාවන් සිදු කිරීම.
- ලංකා සීනි සමාගමේ සෙවනගල ඒකකය සඳහා සුදුසු උක් වගා භූමි යෝග්‍යතා ඇගයීමට අදාළ විශ්ලේෂණ සේවාවන් හා නිර්දේශ ලබාදීම.
- සීඅයිසී කෘෂි ව්‍යාපාර ආයතනය සඳහා පොහොර විශ්ලේෂණ සේවාවන් ලබා දීම.
- ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ සීනි සාම්පල රසායනාගාර පරීක්ෂාවට අදාළ විශ්ලේෂණ සේවාවන් හා තාක්ෂණික සහාය ලබා දීම.

පුහුණු අභ්‍යාසලාභීන්

- කොළඹ විශ්වවිද්‍යාලයේ, තාක්ෂණික පීඨයේ, කෘෂි තාක්ෂණික දෙපාර්තමේන්තුවේ උපාධි අපේක්ෂිකාවක් වන ඩබ්.ඒ.එස්.ඒච්. එවන්ති ශිෂ්‍යාව අවසන් වසරේ පරීක්ෂණ ව්‍යාපෘතිය ලෙස යූඒවී (UAV) ඩ්‍රෝන තාක්ෂණයෙන් උක් ප්‍රභේද හඳුනාගැනීම අධීක්ෂණය කිරීම .
- කොලඹ විශ්වවිද්‍යාලයේ, තාක්ෂණික පීඨයේ, කෘෂි තාක්ෂණික දෙපාර්තමේන්තුවේ උපාධි අපේක්ෂිකාවක් වන එම්.සී. රසාංගිකා ශිෂ්‍යාව අවසන් වසරේ පරීක්ෂණ ව්‍යාපෘතිය වන යූඒවී (UAV) ඩ්‍රෝන තාක්ෂණය භාවිතයෙන් උක් වගාවන්වල අස්වනු ගුණාංග නිර්ණය කිරීම අධීක්ෂණය කිරීම.
- රජරට විශ්වවිද්‍යාලයේ, කෘෂිකර්ම පීඨයේ අයි.ඩී. මධුවන්ති ශිෂ්‍යාව සඳහා රසායනාගාර පුහුණුව ලබාදීම.
- සබරගමු විශ්වවිද්‍යාලයේ, තාක්ෂණික පීඨයේ ආර්. ඒ. එස්. එම්. රණතුංග ශිෂ්‍යාව හා කේ. එම්. ජේ. කේ. බන්ඩාර ශිෂ්‍යයා සඳහා රසායනාගාර පුහුණුව ලබා දීම.
- උසස් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව - ලබුදුව ආයතනයේ ඒ.එම්.අයි ඩී. අබේසිංහ ශිෂ්‍යාව සඳහා පුහුණුව ලබා දීම.
- ඇඹිලිපිටිය කාර්මික විද්‍යාලයේ අයි.ආර්.එම්.එම්. නෙත්මි සන්දුපා ශිෂ්‍යාව, කේ.එම්. නිමේෂිකා චතුරංගනී ශිෂ්‍යාව, ආර්.පී.එන්.ලක්ෂාන් ශිෂ්‍යා හා ඩබ්.කේ. ශෙහාන් තරින්ද ශිෂ්‍යාව සඳහා බෝග පෝෂණ අංශයේ පුහුණුව ලබා දෙන ලදී.

බෝග ආරක්ෂණ අංශය


කාර්ය මණ්ඩලය

ආචාර්ය කේ.එම්.ජී. වංචලා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති, දර්ශනශූරී)	-	**කාර්යය භාර පර්යේෂණ නිලධාරී**
වී.කේ.ඒ.එස්.එම්. වනසිංහ මිය (විද්‍යාවේදී, විද්‍යාපති)	-	**පර්යේෂණ නිලධාරී**
ආචාර්ය ඒ.එන්.ඩබ්ලිව්.එස්. තුෂාරි (විද්‍යාවේදී, දර්ශනශූරී)	-	**පර්යේෂණ නිලධාරී**
ඒ.එල්.සී. කෝදාගොඩ මයා (කෘෂි ඩිප්ලෝමා)	-	**තාක්ෂණික නිලධාරී** (2024.09.06 ඉල්ලා අස්විය)
ආර්.කේ.සී. ජීවන්ති මිය (විද්‍යාවේදී, වැවිලි කළමනාකරණ)	-	**තාක්ෂණික නිලධාරී**
එම්.ආර්. ප්‍රේමලාල් මයා	-	**රසායනාගාර/ක්ෂේත්‍ර සහායක**
ජේ.කේ.යූ. මධුශංක මයා (වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා)	-	**රසායනාගාර/ක්ෂේත්‍ර සහායක**
ආර්.ජී.එස්.එල්. ප්‍රේමතිලක මයා	-	**රසායනාගාර/ක්ෂේත්‍ර සහායක**

ජයග්‍රහණ

පර්යේෂණ

- ධාන්‍ය බෝග විශේෂ 08ක්, පොඩර් විශේෂ 04ක්, පොඒසියේ කුලයට අයත් තෘණ ප්‍රභේද 10ක් සහ අතුරුබෝග විශේෂ 10ක් අධ්‍යනයෙන් පසු සුදු පත්‍ර රෝග වාහකයාට විකල්ප ධාරක ශාක ලෙස ක්‍රියා කිරීමට විභවයක් ඇති (රතු බඩ ඉරිහු සහ ගිනියා බඩ ඉරිහු) ශාක විශේෂ දෙකක් හඳුනා ගැනීම .




රූපය 1: හඳුනාගත් සුදු පත්‍ර රෝග වාහකයාට නව විකල්ප ධාරක විශේෂ; (A හා B) රතු කොසු ඉරිහු සහ (C හා D) ගිනියා ඉරිහු

- උක් වගාවේ කඳන් විදින පණුවා පාලනය කිරීමට අදාළ රසායනික නිර්දේශය සකස් කර අවසන් කිරීම
  - යොදන ස්ථානය: පස
  - කෘමිනාශකය: ක්ලෝරන්ට්‍රැනිලිප්‍රෝල් 0.4% (w/w) G
  - යෙදීම අනුපාතය: 14Kg/ha (එක් යෙදුමකට)
  - යෙදීමේ කාලය: සිටුවීමේ සිට මාස 5 1/2 දක්වා දින 55 ක පරතරයකින් යෙදීම් හතරක්
  - යෙදීමේ ක්‍රමය: මූල කලාපයට ආසන්නව
- උක් වගාවේ කඳන් විදින පණුවා ගේ ගැහැණු සලබයා සඳහා උගුල් බෝග ලෙස භාවිතා කිරීම සඳහා සුදුසු, ඔවුන් සඳහා ආකර්ශකයක් වන බීටා-ඔසිමේන් (β-ocimene) වලින් පොහොසත් එරියන්තස් විශේෂයන් 5ක් හඳුනා ගැනීම; IND 81 80, PG 56, MINDANOO, SES 03 සහ SES 75.
- උක් පළිබෝධ කළමනාකරණය සඳහා රසායනික නොවන උපායමාර්ග සංවර්ධනය කිරීම, එනම් කොහොඹ කොළ සහ බීජ පැසවීම මගින් ලබා ගන්නා ශාක සාරය, ජලීය

නිස්සාරණයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ කාර්යක්ෂමතාවයකින් උක් වූල් කුඩිත්තන් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ හැකියාවක් ඇති බව හඳුනා ගැනීම.

- සුදු පත්‍ර රෝග වාහකයා පාලනය සඳහා ඵලදායී කෘමි රෝගකාරක (entomopathogenic) දිලීරයක් ලෙස *Buvaraia basiana* හඳුනා ගැනීම.



රූපය 2: *B. Bassiana* දිලීරය මගින් ආසාදනය වූ සුදු පත්‍ර රෝග වාහකයා *(D. menoni*)
A) *B. bassiana* දිලීරය මගින් ආසාදනය වූ *D. menoni*, B) *B. bassiana* ඉහළ පැති දර්ශනය C) B. *bassiana* පහළ පැති දර්ශනය.

- ශ්‍රී ලංකාවේ උක් පළිබෝධකයන්ගේ ජෛව පාලන හැකියාව ඇති දිලීර වර්ග දෙකක අණුක ලක්ෂණකරණය (Molecular characterization) සිදු කිරීම.
- ශාක වර්ධනය ප්‍රවර්ධනය කරන ලක්ෂණ සහිත *Providencia xianensis, Pseudomonas cyclaminis, Enterobacter bugandensis, Burkholderia cepacia, Bacillus subtilis* සහ *Bacillus cereus* යන බැක්ටීරියා විශේෂ 6ක අණුක ලක්ෂණකරණය (Molecular characterization) සිදු කිරීම.
- ශ්‍රී ලංකාවේ උක් සුදු පත්‍ර රෝග කාරකයා වන ෆයිටොප්ලාස්මා සඳහා විශේෂිත ප්‍රයිමර් භාවිතා කරමින් උක් වල පවතින ෆයිටොප්ලාස්මා සාන්ද්‍රණය/ටයිටරය ප්‍රමාණනය කිරීම සඳහා qPCR ප්‍රොටෝකෝලය ප්‍රශස්ත කිරීම.

සේවාවන්

- චීනයෙන් ආනයනය කරන ලද උක් ප්‍රභේද 29ක් නිරෝධායන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් පසු ජාන එකතුව සඳහා මුදා හැරීම.
- චීනයෙන් ආනයනය කරන ලද මුහුම් 8 කට අයත් උක් බීජ ප්‍රභේද 46ක් නිරෝධායන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් පසු ජාන එකතුව සඳහා මුදා හැරීම.
- කිලිනොච්චි ප්‍රදේශයේ කඳන් විදින පණුවන්ගේ ගහනය පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීම.
- සෙවනගල ලංකා සීනි කර්මාන්තයේ ඉල්ලීම පරිදි, SL 04 624 උක් ප්‍රභේදය කඳන් විදින පණුවාට ගොදුරු වීමේ ප්‍රවනතාවය පිළිබඳ වැඩිදුර ඇගයීමක් පැවැත්වීම
- සියලුම සීනි කර්මාන්තවල සුදු පත්‍ර රෝග වාහකයා ගහනය පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීම සහ තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා නිර්දේශ ලබා දීම.
- ගල්-ඔය සීනි කර්මාන්තයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා උක් පළිබෝධ සහ රෝග කළමනාකරණය, විශේෂයෙන් සුදු පත්‍ර රෝග වාහකයා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
- දෙනියාය උපමධ්‍යස්ථානයේ ආසාදනය වූ උක් ප්‍රභේද පරීක්ෂා කිරීම, හඳුනා ගැනීම සහ අවශ්‍ය නිර්දේශ ලබා දීම.

- සුදු පත්‍ර රෝග ෆයිටොප්ලාස්මා සාන්ද්‍රණය අඩු කිරීම සඳහා සැලිසිලික් අම්ලය ඉසීමේ විභවය අධ්‍යයනය කිරීම.
- 2019 ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන යටතේ "ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ උක් සුදු පත්‍ර රෝගයේ උපායමාර්ගික කළමනාකරණය සකස් කිරීම" යන මාතෘකාව යටතේ පැවති වැඩමුළුවේ අවසාන වාර්තාව ඉදිරිපත් කිරීම.

අභ්‍යාසලාභීන් පුහුණු කිරීම

- කොළඹ විශ්ව විද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ ඩබ්ලිව්.ජී.සී.ජේ.එන්. විජේරත්න ශිෂ්‍යාවගේ අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘතිය වන ‘‘ශ්‍රී ලංකාවේ උඩවලවේ උක් සුදු පත්‍ර රෝගයේ (WLD) විභව වාහකයන්’’ පිළිබඳ අධ්‍යයනය අධීක්ෂණය කිරීම.
- කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ ආර්.එම්.පී.ඩබ්ලිව්. සුමනරත්න ශිෂ්‍යාවගේ අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘතිය වන ‘‘ශ්‍රී ලංකාවේ, උක් සුදු පත්‍ර රෝග (WLD) වාහක, *ඩෙල්ටොසෙෆලස් මෙනෝනි* සඳහා විකල්ප ධාරක විශේෂ’’ පිළිබඳ අධ්‍යයනය අධීක්ෂණය කිරීම.
- කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ ආර්.එම්.එස්. ශ්‍රීමාල් ශිෂ්‍යාගේ අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘතිය වන "උක් වූල් කුඩිත්තන් කළමනාකරණය කිරීම සඳහා කොහොඹ කොළ සහ බීජ පැසවීම මගින් මගින් ලබා ගන්නා ශාක සාරය භාවිතා කිරීමේ හැකියාව" පිළිබඳ අධ්‍යයනය අධීක්ෂණය කිරීම.
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ජෛව පද්ධති තාක්ෂණ අංශයේ කේ. එස්. තමේෂා ශිෂ්‍යාවගේ අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘතිය වන ‘‘සුදු පත්‍ර රෝග ෆයිටොප්ලාස්මා අඩු කිරීම සඳහා සැලිසිලික් අම්ලයේ කාර්යක්ෂමතාව තීරණය කිරීම’’ පිළිබඳ අධ්‍යයනය අධීක්ෂණය කිරීම.
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ජෛව පද්ධති තාක්ෂණ අංශයේ ආර්.ඒ.එස්. මධුරංගි ශිෂ්‍යාවගේ අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘතිය වන ‘‘උක් සුදු කොළ රෝග වාහකය (*ඩෙල්ටොසෙෆලස් මෙනෝනි*) කළමනාකරණය කිරීමේ දී කෘමි රෝගකාරක, *බියුවේරියා බැසියානා* වල කාර්යක්ෂමතාව ඇගයීම’’ පිළිබඳ අධ්‍යයනය අධීක්ෂණය කිරීම.
- කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ ආර්. සුරේන්ද්‍ර කාන්ත් ශිෂ්‍යාගේ අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘතිය වන "උක් වූල් කුඩිත්තන් කළමනාකරණය කිරීම සඳහා පැසවීම මගින් ලබා ගන්නා, දුම්කොළ (*නිකොටියානා ටැබකම්*) සාරය භාවිතා කිරීමේ හැකියාව" පිළිබඳ අධ්‍යයනය අධීක්ෂණය කිරීම.
- රුහුණු විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ එච්.කේ.එන්.රණහන්සි ශිෂ්‍යාව හට අණුක ජීව විද්‍යාව, ව්‍යාධි විද්‍යාව සහ ක්ෂුද්‍රජීව විද්‍යා අංශ ආවරණය කරමින් මාස 6 ක පුහුණුවක් ලබා දීම.

සැකසුම් තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

එස්.ඒම්.ටී.ඒ. මාරලන්ද මිය (කෘෂි විද්‍යාවේදී ,විද්‍යාපති)	-	**කාර්ය භාර පර්යේෂණ නිලධාරී**
එම්.එච්.ආර්.පී. රණසිංහ මිය (ඉංජිනේරු විද්‍යාවේදී)	-	**පර්යේෂණ නිලධාරී** (02 .05.2024 සිට)
එම්.ඒ.ආර්.අයි. පෙරේරා මිය (කෘෂි ඩිප්ලෝමා, කෘෂි විද්‍යාවේදී)	-	**තාක්ෂණ නිලධාරී**
ඩබ්ලිව්.කේ.ඩී.එස්. කරුණාරත්න මයා (කෘෂි කර්ම ඩිප්ලෝමා)	-	**තාක්ෂණ නිලධාරී**

පර්යේෂණ

- කුරුඳු රස කළ සීනි නිෂ්පාදනය සඳහා වට්ටෝරුවක් වැඩිදියුණු කිරීම සහ එම නිෂ්පාදනය සඳහා ජෛව රසායනික විශ්ලේෂණය පැවැත්වීම
- එනසාල් රස කළ සීනි නිෂ්පාදනය සඳහා වට්ටෝරුවක් වැඩිදියුණු කිරීම
- ගුණාත්මක බිම්මල් වගාව සඳහා උපස්ථරයක් ලෙස ලී කුඩු සමඟ ඒකාබද්ධව බැගෑස් භාවිතා කිරීමේ හැකියාව හදුනා ගැනීම
- ගුණාත්මක උක් හකුරු නිෂ්පාදනය කෙරෙහි කාබනික වගාවේ බලපෑම අධ්‍යයනය කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවක් ස්ථාපිත කර පවත්වාගෙන යාම.
- විනෑස් වල රසායනික ඔක්සිජන් ඉල්ලුම සහ ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම අඩු කිරීම සඳහා ස්වාභාවික පරිසර හිතකාමී ක්‍රමයක් හදුනා ගැනීම.
- උක් හකුරු නිෂ්පාදනය සඳහා උක් වගාවක් ස්ථාපිත කර පවත්වාගෙන යාම.
- සෙවනගල උක් වගා කරන ලද ක්ෂේත්‍රවලින් එකතු කරන ලද පස් සහ මුල් සාම්පලයෙන් නයිට්‍රජන් සවිකරන සහ පොස්පරස් ද්‍රාව්‍ය කරන බැක්ටීරියා විසන්ගමනය කිරීම සහ ජෛව රසායනික ලක්ෂණ අධ්‍යයනය කිරීම

සේවා

- රුහුණු, ශ්‍රී ජයවර්ධනපුර, සබරගමුව සහ වයඹ විශ්වවිද්‍යාලවල සහ ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සිසුන් සඳහා උක් සැකසීම සහ අතුරු නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- හකුරු නිෂ්පාදකයින් සහ ආයෝජකයින් සඳහා හකුරු නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම
- ක්ෂේත්‍ර අත්හදා බැලීම් වලදී අස්වනු නෙළන ලද උක් වලින් හකුරු කිලෝග්‍රෑම් 2312.5 ක් නිෂ්පාදනය කිරීම
- ප්‍රදර්ශන කටයුතු සඳහා විවිධ හැඩැති හකුරු, විවිධ රසැති හකුරු, උක් යුෂ බීම සහ උක් සිරප් නිෂ්පාදනය කිරීම

පුහුණු අභ්‍යාසලාභීන්

- රුහුණු විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයෙකු වන ආර්.ඒ.ඩී.ඩී. වන්දුල ශිෂ්‍යාගේ, මධ්‍යසාර පැසවීම සඳහා දේශීය යීස්ට් විසංගමනය කිරීම මගින් අන්නාසි ඇතුළත් උක් පාදක වයින් පානයක් සංවර්ධනය කිරීම පිළිබඳ අධ්‍යයනය අධීක්ෂණය කිරීම.
- රුහුණු විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක ඩබ්ලිව්.එස්.ඩබ්ලිව්. සෙව්වන්දි ශිෂ්‍යාවගේ අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘතිය වන එනසාල් රසය එකතු කර වැඩිදියුණු කරන ලද සීනි නිෂ්පාදනය පිළිබඳ අධ්‍යයනය අධීක්ෂණය කිරීම.

- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ඩබ්ලිව්.වී.ඩී. සුභාෂිණී ශිෂ්‍යාවගේ අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘතිය වන උක් පැණිවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම පිළිබඳ අධ්‍යයනය අධීක්ෂණය කිරීම.
- සබරගමුව විශ්වවිද්‍යාලයේ සිසුවියක් වන එච්.එම්.එම්.හෙට්ටිආරච්චි මෙනවියගේ අවසන් වසරේ ව්‍යාපෘතිය, ඉඟුරු රසැති උක් ලොලිපොප් වැඩිදියුණු කිරීම පිළිබඳ අධ්‍යයනය අධීක්ෂණය කිරීම.
- රුහුණු විශ්වවිද්‍යාලයේ සිසුන් වන ඩබ්ලිව්.එස්.ඩබ්ලිව්.සෙව්වන්දි සහ ආර්.ඒ.ඩී.ඩී.වන්දුල 2023 ජූලි 07 සිට 2024 ජනවාරි 11 දක්වා මාස හයක කාලයක් උක් අතුරු නිෂ්පාදන සැකසුම් පර්යේෂණ පිළිබඳව පුහුණු කිරීම
- රජරට විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ සිසුන් වන පී.ඩබ්ලිව්.එම්.පී. සෝමසිරි, එච්.ඩබ්ලිව්.එස්.එම්. රත්නසිරි, ඒ.කේ.එස්.ඒ. තිලකරත්න 2023 ඔක්තෝම්බර් 04 සිට 2024 මාර්තු 29 දක්වා උක් අතුරු නිෂ්පාදන ක්‍රියාවලියේ පර්යේෂණ පිළිබඳ මාස හයක කාලයක් පුහුණු කිරීම.
- රජරට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යාවක් වන එච්.එස්.කේ. ලක්මාලි මහත්මිය උක් නිෂ්පාදන ක්‍රියාවලියේ අතුරු නිෂ්පාදන පර්යේෂණ පිළිබඳ 2024 ජුනි 18 සිට 2024 දෙසැම්බර් 18 දක්වා මාස හයක කාලයක් පුහුණු කිරීම
- රුහුණු විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ආර්. සී. රූබසිංහ මහතා 2024 ජුනි 27 සිට 2024 දෙසැම්බර් 28 දක්වා මාස හයක් උක් අතුරු නිෂ්පාදන සැකසුම් පර්යේෂණ පිළිබඳව පුහුණු කිරීම
- සබරගමුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය කේ.එම්.ජයෂාන් සැකසුම් පර්යේෂණ පිළිබඳව 2024 මාර්තු 25 සිට 2024 ජූනි 18 දක්වා මාස හයක කාලයක් පුහුණු කිරීම.

යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

කේ.එච්.ඩී. අබේරත්න මයා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති)	-	කාර්යය භාර පර්යේෂණ නිලධාරී
ඕ.එන්.එස්. වීරරත්න මිය (කලාවේදී)	-	සංවර්ධන නිලධාරී
ඒ.එම්.එස්.ඒ. ප්‍රනාන්දු මයා (තාක්ෂණික ඩිප්ලෝමා)	-	ජේෂ්ඨ තාක්ෂණ නිලධාරී
වී. අබේගුනවර්ධන මයා	-	**පෑස්සුම්කරු**
ජී. ආරියරත්න මයා	-	**වෑද්දුම්කරු**
ඩබ්ලිව්.ඒ. පේමවන්ද්‍ර මයා	-	**කම්මල්කරු**
ඩී.එම්.එල්. වීරසිරි මයා	-	**කාර්මික**
ඩී.එම්. වීරසිරි මයා	-	**රසායනාගාර / ක්ෂේත්‍ර උපස්ථායක**

අත්පත්කර ගැනීම්

- රෝද හතරේ ට්‍රැක්ටරයකට සවිකර ක්‍රියා කළ හැකි කාබනික පොහොර කැට යොදන යන්ත්‍රයේ ක්ෂේත්‍ර ඇගයීම් කිරීම (එස් ආර් අයි - එෆ් එක්ස් 401)
- රෝද හතරේ ට්‍රැක්ටරයකට සවිකර ක්‍රියා කළ හැකි අතුරුයත්ගෑමේ උපකරණ ක්ෂේත්‍ර ඇගයීම් කිරීම.
- ඩ්‍රෝන භාවිතයෙන් අවකාශීය දත්ත ලක්ෂ්‍ය (points) 12,000ක් එකතු කිරීම.

සේවාවන්

- උක් පර්යේෂණ ආයතනීය ගොවිපොළේ සහ උක් තවාන් වටා පිහිටි විදුලි වැටවල වෝල්ටීයතාවය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම.
- බෝග වැඩිදියුණු කිරීමේ අංශය විසින් උක් පර්යේෂණ ආයතනීය ගොවිපොළේ අලුතින් සංවර්ධනය කරන ලද තවාන වටා ජී අයි පයිප්ප භාවිතයෙන් දැල් වැටක් ඉදිකිරීම.
- උක් පර්යේෂණ ආයතනයේ හකුරු ඒකකයේ උදුන් සහ යුෂ ටැංකිය ප්‍රතිසංස්කරණය කිරීම හා සියලුම උපකරණ නැවත සකස් කිරීම
- පර්යේෂණ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සේවා සැපයීම
- උක් පර්යේෂණ ආයතනයේ වාහන සහ ගොවිපොළ උපකරණ නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම

ආර්ථික විද්‍යා ජෙවමිතික සහ තොරතුරු තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

කේ.ඒ.ඩී. කොඩිතුවක්කු මයා (කෘෂි විද්‍යාවේදී, MAGR) - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි සහ අංශ ප්‍රධානී
බී.ඩී.එස්.කේ. ආරියවංශ මිය (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති) - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
කේ.ජී.එස්.යූ.ආර්. බණ්ඩාර මයා (විද්‍යාවේදී, HNDIT, CCNA) - තාක්ෂණික නිලධාරි

ජයග්‍රහණ

පර්යේෂණ

- 2024 වසරේ මිල ගණන් මත උක් වගාවේ පිරිවැය සහ ප්‍රතිලාභ යාවත්කාලීන කිරීම. වගා කරන ලද උක් හෙක්ටයාරයකට සාමාන්‍ය පිරිවැය සෙවනගල වාරි පෝෂිත සහ වර්ෂා පෝෂිත අංශ, පැල්වත්ත, ගල්ඔය සහ ඇතිමලේ කම්හල් ප්‍රදේශ සඳහා පිළිවෙලින් රු. 766,548, රු. 602,982, රු. 552,866, රු. 582,945ක් සහ රු.431,026කි. සෙවනගල උක් හෙක්ටයාරයකින් වසරකට සාමාන්‍ය ශුද්ධ ආදායම රුපියල් 240,952 සහ 104,518 ලෙස පිළිවෙලින් වාරි සහ වර්ෂා පෝෂිත කලාප සඳහා වාර්තා විය. වර්ෂා පෝෂණය යටතේ පැල්වත්තේ සහ වාරි පෝෂණය යටතේ ගල්ඔය ප්‍රදේශයේ ශුද්ධ ආදායම පිළිවෙළින් හෙක්ටයාරයකට රු. 90,025 ක් සහ රු.157,055ක් වූ අතර, වර්ෂා පෝෂණය යටතේ ඇතිමලේ රු. 68,650ක් වසරකට ශුද්ධ ආදායම ලෙස වාර්තා විය .
- 2023 වසර සඳහා සෙවනගල, පැල්වත්ත, ගල්ඔය සහ ඇතිමලේ සීනි කර්මාන්ත ශාලාවල උක් ටොන් එකක වාණිජ වටිනාකම පිළිවෙලින් රු. 50,229, රු. 44,442, රු. 46,570 සහ රු. 49,153 ලෙස වාර්තා විය. ඒ අනුව, වාරි පෝෂිත අංශයේ සෙවනගල, වර්ෂා පෝෂිත අංශයේ පැල්වත්ත, ගල්ඔය සහ ඇතිමලේ 2023 වර්ෂයේදී ඉඩම් හෙක්ටයාරයකින් නිෂ්පාදනය කරන ලද උක්වල වාණිජ වටිනාකම පිළිවෙලින් රුපියල් මිලියන 4.3, මිලියන 2.2, මිලියන 2.3 සහ මිලියන 2.4 ක් වූ අතර, එය එම ප්‍රදේශයේ තරඟකාරී බෝගවල ආදායමට වඩා බෙහෙවින් වැඩි විය.
- 2023 වර්ෂය තුළ සීනි ආනයනය ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙලින් ටොන් 653,000ක් හා රු. බිලියන 142 ලෙස ඇස්තමේන්තු ගත කරන ලදී.
- 2023 වර්ෂයේ උක් කර්මාන්තයේ මුළු වටිනාකම රුපියල් බිලියන 34ක් ලෙස ඇස්තමේන්තු කිරීම සහ එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.12% කට ආසන්න විය.

සේවාවන්

- උක් පර්යේෂණ ආයතනය සත්කාරකත්වය සපයන www.sugarres.lk වෙබ් අඩවිය නැවත සැලසුම් කිරීම සහ අවශ්‍ය පරිදි සහ එය යාවත්කාලීන කිරීම.
- "Sugarcane Sri Lanka" සඟරාවේ 5 වැනි කලාපය එළි දැක්වීම සඳහා ලිපි රැස් කිරීම ආරම්භ කිරීම.
- SRI හි අනෙකුත් පර්යේෂණ අංශ සඳහා පහත සඳහන් ජෙවමිතික සේවාවන් සැපයීම:
  i. බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහනේ ප්‍රතිවලිත අස්වනු පරීක්ෂාවන් (RYT) සහ ප්‍රාථමික අස්වනු පරීක්ෂාවන්වල (PYT) දත්ත පිළිබඳ විශ්ලේෂණය සහ
  ii. බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහනේ iii වන පියවරේ ප්‍රතිවලිත අස්වනු පරීක්ෂාවන් සහ ප්‍රාථමික අස්වනු පරීක්ෂාවන්වන්වල දත්ත වගුගත කිරීම, බෝග හා සම්පත්

කළමනාකරණ අංශයේ පරිනතබව පරීක්ෂාකිරීමේ දත්ත සහ බෝග ආරක්ෂණ අංශය (CP), බෝග පෝෂණ අංශය (CN), සහ සැකසුම් තාක්ෂණ අංශය (PT) වලින් ලැබුණු දත්ත විශ්ලේෂණය.

iii. අනෙකුත් පර්යේෂණ අංශ විසින් සිදු කරන පර්යේෂණයන්ගේ දත්ත විශ්ලේෂණය සහ වාර්තා ලිවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සහ සහයෝගය ලබාදීම.

- 2024 වර්ෂය තුළ සිදු කරන ලද පර්යේෂණ අත්හදා බැලීම් සැලසුම් කිරීම. ආයතනය තුළ තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලයට 2023 වසර සඳහා SRI හි තොරතුරු දත්ත ගබඩාව සකස්කර දීම.
- ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ තත්ත්වය පිළිබඳ ජාතික සමාලෝචනය - 2021 සහ 2022 සඳහා දත්ත සකස් කරදීම - NASTEC.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ (NAITA) සිසුන් පස් දෙනෙකු පරිගණක මෘදුකාංග පැකේජ භාවිතය පිළිබඳ මාස හයක කාලයක් පුහුණු කිරීම.

තාක්ෂණ හුවමාරු සහ සංවර්ධන අංශය

කාර්ය මණ්ඩලය

ඩී.පී.ඩබ්ලිව්. පොත්තවෙල මයා (කෘෂි විද්‍යාවේදී, ප.උ. ඩිප්.-ව්‍යා.ක)	-	**කාර්ය භාර තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී**
ඩබ්.ජී.එම්.එස්. වේරගොඩ මයා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	**සංවර්ධන නිලධාරී**
එම්.කේ.සී.පී. ගුණවර්ධන මයා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	**සංවර්ධන නිලධාරී**
ඒ.පී. කරුණාතිලක මයා (කෘෂි විද්‍යාවේදී)	-	**සංවර්ධන නිලධාරී**
ඒ.එන්.එම්.බී.ආර්. ප්‍රභාත් මයා (කෘෂි විද්‍යාවේදී)	-	**සංවර්ධන නිලධාරී**
බී.පී.ජී.එස්. සඳනායක මයා (කෘෂිකර්ම ඩිප්ලෝමා)	-	**ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරී**
ජී. සෝමවීර මයා	-	**කළමනාකරණ සහකාර**

ජයග්‍රහණ

තාක්ෂණ හුවමාරු / සංවර්ධන කටයුතු

- 2024 වර්ෂයේ දී, TTD අංශය අනෙකුත් පර්යේෂණ අංශවල සහාය ඇතිව, ගොවීන් සහ සීනි කර්මාන්ත සේවකයින් සඳහා උක් වගාව, සැකසුම් සහ අදාළ විෂය ක්ෂේත්‍ර පිළිබඳ පුහුණු/දැනුවත් කිරීමේ වැඩසටහන් 29ක් පවත්වන ලදී/සම්බන්ධීකරණය කරන ලදී. මේ සඳහා 1,283 දෙනෙකු සහභාගී වී ඇත. මීට අමතරව, ආයතනයේ විවිධ පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම මත පුහුණු කිරීම්, දැනුවත් කිරීමේ වැඩසටහන් 13ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා පුද්ගලයින් 877 දෙනෙකු (ශිෂ්‍යයින්, ව්‍යවසායකයින් ආදී) සහභාගී වී ඇත.
- ආයතනයේ පර්යේෂණ ගොවිපළේ ස්ථාපිත කර ඇති ආදර්ශන සහ ගුණන වගාවන් නඩත්තු කිරීම.
- කන්තලේ උප මධ්‍යස්ථානයේ ස්ථාපිත කරන ලද ගුණනය කිරීමේ තවාන් නඩත්තු කිරීම සහ එදිනෙදා කටයුතු සිදු කිරීම.
- උක් ක්ෂේත්‍රයේ පර්යේෂකයන්, ව්‍යාප්ති නිලධාරීන් සහ ගොවීන් අතර පණිවිඩ හුවමාරු කිරීම සඳහා SRI TTD eSMS සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම. ආයතනයේ FB පිටුව, YouTube නාලිකාව සහ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම. මීට අමතරව, ආයතනයීය පුවත්පතෙහි වෙළුම-13 ප්‍රකාශයට පත් කිරීම.
- මෙම වර්ෂය තුළ ගොවීන්/ක්ෂේත්‍ර නිරීක්ෂණ 169ක් සිදු කර ඇත (46 - පැල්වත්ත/මොනරාගල, 57 සියඹලාණ්ඩුව / ඇනිමලේ, 45 හිඟුරාන, සහ 19 සෙවනගල වශයෙන්)

ගොවීන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ ශිෂ්‍යයින් සඳහා වූ පුහුණු වැඩසටහන්/ආදර්ශනවල සහ සංවර්ධන වැඩසටහන්වල ප්‍රමුඛත්වය ලත් තාක්ෂණික අංශ/විෂය ක්ෂේත්‍ර සහ ක්‍රියාකාරකම් ආවරණය කරන ලදී;

උක් වගා පද්ධති, සැකසුම් සහ අතුරු නිෂ්පාදන භාවිතය පිළිබඳ තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම

- පර්යේෂණ ගොවිපොළෙහි, නිර්දේශිත උක් ප්‍රභේදවල ආදර්ශන/ගුණ කිරීමේ බිම් කොටස් ආසන්න වශයෙන් අක්කර 0.5ක භූමියක් ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම. මෙම ක්ෂේත්‍ර ආදර්ශන කටයුතු සඳහා භාවිතා කරන ලදී.
- SL 00 652/SL 96 128 ප්‍රභේද සමඟ හෙක්ටයාර 0.7ක ගුණනය කිරීමේ ඉඩමක් ස්ථාපිත කර පවත්වාගෙන යාම.
- ගොවීන්/ක්ෂේත්‍ර නිරීක්ෂණ 169ක් සිදු කර ඇත (46 - පැල්වත්ත/මොනරාගල, 57 සියඹලාණ්ඩුව / ඇනිමලේ, 45 හිඟුරාන, සහ 19 සෙවනගල)

වගුව 01: අංශය මඟින් පවත්වන/සම්බන්ධීකරණය කරන ලද වැඩසටහන්

දිනය	වැඩසටහන/ආවරණය කරන ලද විෂය ක්ෂේත්‍ර	කා සඳහාද	සහභාගීවුවන් සංඛ්‍යාව	ස්ථානය
10.01.24	උක් වගාවේ වල් මර්දනය	පැල්වත්ත සීනි සමාගමේ කෘෂි නිලධාරීන්	95	පැල්වත්ත
08.02.24	උක් වගා කටයුතු සම්බන්ධ සියලු කරුණු	පැල්වත්ත, වරුණගම ප්‍රදේශයේ ගොවීන්	30	වරුණගම, පැල්වත්ත
15.01.24	උක් වගා කටයුතු සම්බන්ධ සියලු කරුණු	පැල්වත්ත, හඳපානාගල ප්‍රදේශයේ ගොවීන්	40	හඳපානාගල, පැල්වත්ත
16.02.24	විදේශීය ප්‍රභේද ක්ෂේත්‍ර ඇගයීම	ගල්ඔය වැවිලි සමාගමට අනුබද්ධ නිලධාරීන්	42	ගල්ඔය වැවිලි (පුද්) සමාගම
28.02.24	උක්වල ගුණාත්මය වැඩි දියුණු කිරීම	සෙවනගල සීනි සමාගමට අනුබද්ධ නිලධාරීන්	31	උක් පර්යේෂණ ආයතනය
05.03.24	උක් පර්යේෂණ ආයතනය සහ එහි කාර්යභාරය සම්බන්ධ හැඳින්වීමක	සෙවනගල සීනි සමාගමට අලුතින් බඳවාගත් නිලධාරීන්	19	උක් පර්යේෂණ ආයතනය
06.03.24	උක් වගා කටයුතු සම්බන්ධ සියලු කරුණු	වැල්ලවාය, උල්කන්ද ප්‍රදේශයේ ගොවීන්	50	උල්කන්ද, වැල්ලවාය
15.03.24	උක් වගා කටයුතු සම්බන්ධ සියලු කරුණු	පැල්වත්ත, හඳපානාගල ප්‍රදේශයේ ගොවීන්	35	හඳපානාගල, පැල්වත්ත
27.03.24	උක් වගා කටයුතු සම්බන්ධ සියලු කරුණු	බ්ලොක් 10, පැල්වත්ත ප්‍රදේශයේ ගොවීන්	35	බ්ලොක් 10, ලංකා සීනි සමාගම, පැල්වත්ත
2024 මාර්තු	පොහොර යොදනය ක්ෂේත්‍රයේ ක්‍රියා කරවීම සම්බන්ධ ක්‍රම ආදර්ශන කිහිපයක්	ගොවීන් සහ නිලධාරීන්	72	හිඟුරාන
2024 මාර්තු	ඩිස්ක් මෝල්ඩරය ක්ෂේත්‍රයේ ක්‍රියා කරවීම සම්බන්ධ ක්‍රම ආදර්ශන කිහිපයක්	ගොවීන් සහ නිලධාරීන්	69	ඇතිමලේ
14.05.24	උක් වගා කටයුතු සම්බන්ධ සියලු කරුණු	ඇතිමලේ ප්‍රදේශයේ ගොවීන්	38	ඇතිමලේ

15.05.24	උක් වගා කටයුතු සම්බන්ධ සියලු කරුණු	ඇතිමලේ ප්‍රදේශයේ ගොවීන්	40	ඇතිමලේ
21.05.24	උක් වගා කටයුතු සම්බන්ධ සියලු කරුණු	වැල්ලවාය ඇතිලිවැව ප්‍රදේශයේ ගොවීන්	63	ඇතිලිවැව, වැල්ලවාය
22.05.24	උක් වගා කටයුතු සම්බන්ධ සියලු කරුණු	බ්ලොක් 09, පැල්වත්ත ප්‍රදේශයේ ගොවීන්	35	Block 09 – LSC (Pelwatte)
28.05.24	උක් වගා කටයුතු සම්බන්ධ සියලු කරුණු	ඇතිමලේ ප්‍රදේශයේ ගොවීන්	38	ඇතිමලේ
29.05.24	පළිබෝධනාශක භාවිතය	සෙවනගල සීනි සමාගමට අනුබද්ධ කෘෂි නිලධාරීන්	35	SRI
30.05.24	උක් වගා කටයුතු සම්බන්ධ සියලු කරුණු	ඇතිමලේ ප්‍රදේශයේ ගොවීන්	38	ඇතිමලේ
30.05.24	පලිබෝධනාශක භාවිතය	සෙවනගල ප්‍රදේශයේ ගොවීන්	40	SRI
02.06.24	උක් වගා කටයුතු සම්බන්ධ සියලු කරුණු	ඇතිමලේ ප්‍රදේශයේ ගොවීන්	59	ඇතිමලේ
26.06.24	වල් මර්ධනය සහ පළිබෝධනාශක භාවිතය	ගල්ඔය සීනි සමාගමට අනුබද්ධ ගොවීන්	49	හිඟුරාන
29.06.24	උක්වල ගුණාත්මය වැඩිදියුණු කිරීම සහ කර්මාන්තශාලා නිරීක්ෂණය	පැල්වත්ත ප්‍රදේශයේ ගොවීන්	63	පැල්වත්ත/පැල්වත්ත සීනි කර්මාන්තශාලාව
03.07.24	2002, 2003, සහ 2004 ශ්‍රේණිවලට අයත් ප්‍රභේදවල ක්ෂේත්‍ර ඇගයීම	සෙවනගල සීනි කර්මාන්තශාලාවට අනුබද්ධ ගොවීන් සහ නිලධාරීන්	42	සෙවනගල
25.07.24	උක්වල ගුණාත්මය වැඩිදියුණු කිරීම සහ කර්මාන්තශාලා නිරීක්ෂණය	පැල්වත්ත ප්‍රදේශයේ ගොවීන්	40	පැල්වත්ත/පැල්වත්ත සීනි කර්මාන්තශාලාව
26.07.24	උක් වගාවේ රෝග හා පළිබෝධ කළමනාකරණය	සෙවනගල ප්‍රදේශයේ ගොවීන්	45	උක් පර්යේෂණ ආයතනය
06.08.24	උක් වගාවේ රෝග හා පළිබෝධ කළමනාකරණය	ගල්ඔය සීනි සමාගමට අනුබද්ධ ගොවීන්	29	හිඟුරාණ

22.08.24	උක්වල ගුණාත්මය වැඩිදියුණු කිරීම	පැල්වත්ත ප්‍රදේශයේ ගොවීන්	32	පැල්වත්ත
27.11.24	උක්වල ගුණාත්මය වැඩිදියුණු කිරීම	ඇතිමලේ සීනි සමාගමේ නිලධාරීන්	24	ඇතිමලේ
10.12.24	උක් වගා කටයුතු සම්බන්ධ සියලු කරුණු	බුත්තල ප්‍රදේශයේ ගොවීන්	55	බුත්තල
Total	**29**		**1,283**	

සටහන: මෙම පුහුණුවීම්/දැනුවත් කිරීම්/ආදර්ශන පැවැත්වීමේදී අවශ්‍ය අවස්ථාවන්හි දී, අදාළ අංශයන්හි සහය ලබා ගන්නා ලදී.

ගෘහ මට්ටමේ සීනි කර්මාන්තය දියුණු කිරීම

- ව්‍යවසායකයින් 7 දෙනෙකු (සෙවනගල) සඳහා උක් හකුරු සහ පැණි නිෂ්පාදනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් උක් පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලදී.
- පුද්ගලයින් 26 දෙනෙකු සඳහා උක් වගාව, උක් හකුරු සහ පැණි නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් උක් පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලදී.
- දෑලතුර/ජා ඇල ප්‍රදේශයේ උක් වගාව ආරම්භ කිරීමට කැමැත්තෙන් සිටින ගොවීන් 26 දෙනෙකු වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- මොනරාගල දිස්ත්‍රික්කයේ කුඩා පරිමාණ නිෂ්පාදකයින් 4 දෙනෙකු සඳහා උපදේශන සැසි පැවැත්වීම.
- ගාල්ල, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දී ව්‍යවසායකයින් පිරිසක් සඳහා උක් වගාව, උක් හකුරු සහ පැණි නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

උක් තවාන් සංවර්ධනය (කන්තලේ)

- අක්කර 10 ක පමණ උක් වගාවන් නඩත්තු කිරීම.
- වගාව සහ ආයතනීය පරිශ්‍රයන් හි දෛනික නඩත්තුව සිදු කිරීම.

උක් තවාන් සංවර්ධනය (සෙවනගල, පැල්වත්ත, ඇතිමලේ සහ හිඟුරාන)

- ඇතිමලේ සහ සියඹලාණ්ඩුව ප්‍රදේශවල ප්‍රභේද ගුණනය කිරීමේ/ආදර්ශන වගාවන් පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කිරීම.
- එස්. එල්. 00 652 ක්ෂේත්‍රයේ පළමු නිරි වගාව පවත්වා ගෙන යාම - (හෙක්ටයාර 0.5)
- උක් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශිත උක් ප්‍රභේදවල ආදර්ශනක්ෂේත්‍රයක් ස්ථාපිත කර පවත්වාගෙන යාම
- SL 00 652 හි තවාන නඩත්තු කරන ලද අතර, එමගින් ටොන් 08ක පමණ බීජ උක් ගුණනය කිරීම සඳහා ලංකා සීනි සමාගමේ සෙවනගල ඒකකය වෙත අළෙවි කරන ලදී.

තොරතුරු සහ ප්‍රචර්ධන මධ්‍යස්ථානය – කොළඹ

- උක් පර්යේෂණ ආයතනය විසින් නිෂ්පාදනය කරන ලද සීනි ආශ්‍රිත නිෂ්පාදන, ආදර්ශන අරමුණු සඳහා මධ්‍යස්ථානයේ තබා ඇත.
- උක් හකුරු කිලෝග්‍රෑම් 760 ක් සහ සිරප් ලීටර් 18 ක් මධ්‍යස්ථානයේ අලෙවි කරන ලදී.

පාර්ශවකරුවන් විසින් ඉල්ලා සිටින වැඩසටහන් සහ වෙනත් වැඩසටහන්

වගුවේ විස්තර කර ඇති පුහුණුවැඩසටහන්වලට අමතරව, පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- උක් පර්යේෂණ ආයතනීය පුවත් හසුන වෙළුම් 13 කාණ්ඩ 02ක් ප්‍රකාශයට පත් කිරීම
- Sugarcane App ප්‍රචාරණය සඳහා පෝස්ටරයක් මුද්‍රණය කර සීනි කර්මාන්ත ආශ්‍රිත ප්‍රදේශවල ප්‍රදර්ශනයකිරීම.
- උක් ප්‍රභේද සහ සීනි උකහාගැනීම පිළිබඳ ගැටළු සාකච්ඡා කිරීම සඳහා පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ කළමනාකරණ කමිටු රැස්වීමට සහභාගී වීම.
- 2023 වසර සඳහා ආයතනයේ වාර්ෂික වාර්තාව සකස් කිරීම.
- දකුණු පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ‘‘කෘෂි නවෝදය’’ ප්‍රදර්ශනයෙහි ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාම.
- සෙවණගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද ආහාර හා සම්බන්ධ ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාම.
- මොනරාගල, සහ අම්පාර දිස්ත්‍රික්කවල කෘෂිකර්ම කමිටු රැස්වීම් සහ දිස්ත්‍රික්/ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලට සහභාගී වීම.
- දේශගුණික විචල්‍යතාවයේ සමාජ-ආර්ථික බලපෑම් පිළිබඳ පර්යේෂණ සඳහා සීනි අංශය පිළිබඳ පහසු සහ සහය දත්ත රැස් කිරීම : කෘෂිකර්මාන්තයේ තිරසාර ජීවනෝපායන් මොරටුව විශ්ව විද්‍යාලය සහ එක්සත් රාජධානියේ සැල්ෆෝර්ඩ් විශ්ව විද්‍යාලය විසින් සිදු කරනු ලැබේ.
- ආයතනයේ වෙබ් පිටුව, YouTube නාලිකාව, FB පිටුව නිතිපතා යාවත්කාලීන කිරීම.
- සන්නිවේදනය/ ව්‍යාප්තිය පහසු කිරීම සඳහා පැල්වත්ත, සෙවනගල) සහ ඇතිමලේ වැවිලි (පුද්ගලික) සමාගම්වල සියලුම කෘෂිකාර්මික කාර්ය මණ්ඩල සාමාජිකයින් සම්බන්ධකරමින් WhatsApp කණ්ඩායමක් පිහිටුවන ලදී.

පාර්ශවකරුවන් විසින් ඉල්ලාසිටින ලද වැඩසටහන්

දිනය	වැඩසටහන/ආවරණය කරන ලද විෂය ක්ෂේත්‍ර	කා සඳහාද	සහභාගීවුවන් සංඛ්‍යාව	ස්ථානය
05.01.24	උක් වගා කටයුතු/සැකසීම සම්බන්ධ සියලු කරුණු	වයඹ විශ්ව විද්‍යාලයේ සිසු කණ්ඩායමක්	32	උක් පර්යේෂණ ආයතනය
05.01.24	යිස්ට් පරිරක්ෂණය	පැල්වත්ත සීනි සමාගමේ ස්කාගාරයේ නිලධාරීන්	02	උක් පර්යේෂණ ආයතනය
28-29.03.24	ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සංවිධානය කළ විවෘත දිනය ප්‍රදර්ශනයෙහි ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාම	සාමාන්‍ය මහජනතාව	ආසන්න වශයෙන් 500	ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, අතුරුගිරිය
06.05.23	උක් වගා කටයුතු/සැකසීම සම්බන්ධ සියලු කරුණු	කොළඹ විශ්ව විද්‍යාලයේ කෘෂි සහ ග්‍රාමීය තාක්ෂණ පීඨයෙහි සිසු කණ්ඩායමක්	37	උක් පර්යේෂණ ආයතනය

05.08.24	උක් වගා කටයුතු/සැකසීම සම්බන්ධ සියලු කරුණු	සබරගමුව විශ්ව විද්‍යාලයෙහි සිසු කණ්ඩායමක්	19	උක් පර්යේෂණ ආයතනය
08.08.24	උක් වගා කටයුතු/සැකසීම සම්බන්ධ සියලු කරුණු	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙහි සිසු කණ්ඩායමක්	21	උක් පර්යේෂණ ආයතනය
14.08.24	උක් වගා කටයුතු/සැකසීම සම්බන්ධ සියලු කරුණු	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙහි සිසු කණ්ඩායමක්	25	උක් පර්යේෂණ ආයතනය
21.08.24	උක් වගා කටයුතු/සැකසීම සම්බන්ධ සියලු කරුණු	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙහි සිසු කණ්ඩායමක්	45	උක් පර්යේෂණ ආයතනය
04-05.09.23	උක් වගා කටයුතු/සැකසීම සම්බන්ධ සියලු කරුණු	ජාතික වැවිළි කළමනාකරණ ආයතනයේ සිසුන්	23	උක් පර්යේෂණ ආයතනය
22.10.24	උක් වගා කටයුතු/සැකසීම සම්බන්ධ සියලු කරුණු	කොළඹ විශ්ව විද්‍යාලයේ කෘෂි සහ ග්‍රාමීය තාක්ෂණ පීඨයෙහි සිසු කණ්ඩායමක්	133	උක් පර්යේෂණ ආයතනය
18.11.24	උක් වගා කටයුතු/සැකසීම සම්බන්ධ සියලු කරුණු	රුහුණ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සිසුන්	210	උක් පර්යේෂණ ආයතනය
20-24.11.24	දකුණු පලාත් කෘෂිකර්ම දෙපාර්තමේනතුව සංවිධානිත කෘෂි නවෝදය ප්‍රදර්ශනයෙහි, ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාම.	සාමාන්‍ය මහජනතාව	1000+	ලබුදුව කෘෂි ගොවිපොළ, ගාල්ල
22.11.24	සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සංවිධානය කළ ආහාර ප්‍රදර්ශනයෙහි ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාම	සාමාන්‍ය මහජනතාව	400+	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සෙවනගල
Total	**13**		**877**	

ප්‍රකාශන

- වික්‍රමසිංහ, කේ.පී., කෝං, සී.වයි., ලින්, එක්ස්.කියූ., ෂාඕ, පී.එෆ්., මෙහෙදි, එෆ්,. ලී, එක්ස්.ජේ., ලියු, එක්ස්.එල්., මාඕ, ජේ., සහ ලූ, එක්ස්. 2024. උක් අභිජනනයේදී මල් පිපීම පාලනය සඳහා දිවාකාල හා ආලෝකකරණ ප්‍රතිකාර භාවිතය හා එහි ජානමය පාලනය. හෙලියොන්. https://doi.org/10.1016/j.heliyon.2024.e28531
- වික්‍රමසිංහ, කේ.පී., මාඕ, ජේ., ෂූ, සී.එච්., ලින්, එක්ස්.කියූ., ලී, එක්ස්.ජේ., කින්,ඩබ්ලිව්., ලියු, එච්.බී., ලියු. එක්ස්.එල්., මෙහෙදි, එෆ්., ෂාඕ, පී.එෆ්., සහ ලූ, එක්ස්. 2024. උක් ගසේ නව ද්විත්ව අක්ෂීය අංකුර විකෘති උක් ජාන දර්ශයේ අන්තරාසර්ග හෝමෝන හතක සන්සන්දනාත්මක විශ්ලේෂණය. ෂුගර් ටෙක්. 26 (6): 1590-1600. https://doi.org/10.1007/s12355-024-01430-z
- පෙරේරා, ඒ.එම්.එම්.එස්., අත්තනායක, ඩී.පී.එස්.ටී.ජී. සහ විජේසූරිය, ඒ. 2024. ශ්‍රී ලංකාවේ සැකරුම් ජාන ප්ලාස්මයේ ජානමය විවිධත්වය තක්සේරු කිරීම. පාකිස්ථාන් ෂුගර් ජර්නල්. 39(1):5-16.
- මෙහෙදි, එෆ්., ගලනි, එස්., වික්‍රමසිංහ, කේ.පී., ෂාඕ, පී., ලූ, එක්ස්., ලින්, එක්ස්., ෂූ, සී., ලියු,එච්., ලී, එක්ස්., සහ ලියු. එක්ස්. 2024. උක් බෝගයේ සුක්‍රෝස් සමුච්ඡය වීමේ නියාමන යාන්ත්‍රණයන් පිළිබඳ වත්මන් ඉදිරි දර්ශන. හෙළියොන්. https://doi.org/10.1016/j.heliyon.2024.e27277
- ගමගේ, ඩී.ජී.පී.ඩී., ගුණසේන, එම්.ඩී.කේ.එම්., පෙරේරා, ඒ.එම්.එම්.එස්., තුෂාරි, ඒ.එන්.ඩබ්ලිව්.එස්., සහ පෙරේරා, ජේ.කේ.යූ.ඩී. 2024 කැලස් රෝපණය හරහා වර්ධනය වූ උක් (සැකරුම් විශේෂ දෙමුහුම්) ගහනයේ විකෘති විචල්‍යතාවය සහ රෝග ප්‍රතිරෝධය ඇගයීම. පස්වන ජාත්‍යන්තර කෘෂිකාර්මික විද්‍යා සමුළුව (Ag Insight 2024), ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, පිටු අංක 08.
- චාතූර්යා, පී.ජේ., පෙරේරා, ඒ.එම්.එම්.එස්., ගුණසේන, එම්.ඩී.කේ.එම්., සහ දයාසේන, වයි.ඒ.පී.කේ. 2024. අණුක සලකුණු මඟින් සැකරුම් ඔෆිසිනාරුම් සහ එරිඇන්තුස් අරුන්ඩිනේසස් පරම්පරාවේ සැබෑ දෙමුහුම් හඳුනා ගැනීම. තාක්ෂණ සහ ව්‍යාවහාරික විද්‍යාව පිළිබඳව උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය (APSURS). ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, පිටු අංක 104-117.
- ගමගේ, ජී.එන්.එච්., පෙරේරා,ඒ.එම්.එම්.එස්., විදානගමගේ, එස්.එම්.කේ. 2024. එස්.එස්.ආර්.(SSR) භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ උක් ජානප්ලාස්මයේ ජානමය විවිධත්වය තක්සේරු කිරීම. අටවැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය-2024 (IRCUWU-2024), ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය, බදුල්ල.
- විජයවර්ධන, එල්.එම්.ජේ.ආර්., ද සිල්වා, ඒ.එල්.සී., චතුරංග, ජී.ඒ.ඒ. සහ වීරසිංහ, එච්.ඒ.එස්. (2024) ශ්‍රී ලංකාවේ උඩවලව ප්‍රදේශයේ විවිධ ජල සම්පාදන කාල සීමාවන් යටතේ උක් ශාකවල වර්ධනය හා අස්වැන්න මත පිෂ්ඨය පදනම් වූ සුපිරි අවශෝෂක බහු අවයවික (SAP) වල බලපෑම. Journal of Agriculture and Value Addition, 7(2): 58-70.
- තිලකරත්න, ඩබ්ලිව්.පී.ඩී., විජයවර්ධන, එල්.එම්.ජේ.ආර්., නවරත්න, එස්.එල්., වේරගොඩ, ඩබ්ලිව්.ජී.එම්.එස්., සහ දේශාන්, ජේ.ඩී.එස්. (2024). ශ්‍රී ලංකාවේ උක් වගා කරන පසෙහි ජල රඳවා ගැනීමේ ධාරිතාව වැඩි කිරීම සඳහා උක් බැගස් ජෛව අඟුරු වල විභවය තක්සේරු කිරීම. කෘෂි තාක්ෂණය සහ ග්‍රාමීය විද්‍යාව පිළිබඳ 5 වන ජාතික සම්මන්ත්‍රණය - 2024 (පිටු 29). කොළඹ විශ්ව විද්‍යාලයේ කෘෂි තාක්ෂණය සහ ග්‍රාමීය විද්‍යාව පිළිබඳ ආයතනය, ශ්‍රී ලංකාව.
- විජයවර්ධන, එල්. එම්. ජේ. ආර්., වීරසිංහ, කේ. ඩී. එන්., නවරත්න, සී. එම්., මානවඩු, අයි. පී. (2024). ශ්‍රී ලංකාවේ සෙවනගල උක් වගා භූමියේ පාංශු විචල්‍යතාවය හඳුනා ගැනීම සඳහා

වෙබ් පාදක සිතියමක්. ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසමේ 12 වන තරුණ විද්‍යාඥ සංසද සම්මන්ත්‍රණයේ ක්‍රියාදාමයන්.

- කුලසේකර, බී.ආර්., අරියවංශ, බී.ඩී.එස්.කේ., වීරසිංහ, හෙච්.ඒ.එස්., සහ කුමාරසිරි, යූ.ඩබ්ලිව්.එල්.එම්. (2024). ශ්‍රී ලංකාවේ ඇල්ෆිසොල් පස තත්වයන් යටතේ සින්ක් පොහොරය මගින් පස, උක් ඵලදායීතාවය සහ උක් ගුණාත්මක පරාමිතීන් වෙත ඇති ප්‍රතිචාරය: පූර්ව පර්යේෂණයක්.SugarTech.[https://doi.org/10.1007/s12355-023-013531]
- කුමාරසිරි, යූ.ඩබ්ලිව්.එල්.එම්., කුලසේකර, බී.ආර්., තාරිකා, එම්.ඒ.ටී., සහ ගුණතිලකේ, සී. (2024). ඩ්‍රෝන් භාවිතයෙන් යන්ත්‍ර ඉගෙනුම් ඇල්ගොරිතම භාවිතයෙන් උක් ඵලදායීතාවය සහ Brix අගය අනාවැකිය. ස්ථායී සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාල-කාර්මික සහයෝගිතා පිළිබඳ පළමු ජාත්‍යන්තර සම්මේලනයේ ගොනු. In: දිසානායක, ආර්., ජයසිංහ, ජී.වයි., සෙටුන්ගේ, එස්., අමරතුංග, ඩී., ගුණවර්ධන, එල්., ගජනායක, පී. ස්ප්‍රිංගර්, සිංගප්පූරුව (https://doi.org/10.1007/978-981-97-5944-6_39)
- ෂෙහාරා, ඕ.කේ.ඩී.සී., කුලසේකර, බී.ආර්., අම්පිටියවත්ත, ඒ.ඩී., සහ විජේසූරිය, ඩබ්ලිව්.ඒ.එස්. (2024). උක් බැගෑස් බොයිලර් ඇශ් මගින් සකස් කළ කාබන් පොහොර සංවර්ධනය සහ තක්සේරු කිරීම. AgInsight 2024 – 5 වන ජාත්‍යන්තර කෘෂි විද්‍යා සම්මේලනය.
- කුමාරසිරි, යූ.ඩබ්ලිව්.එල්.එම්., විතාරණ, යූ.ඩබ්ලිව්.ඒ., අරියවංශ, ටී., සහ කුලසේකර, බී.ආර්. (2024). පෙව පොහොර යටතේ වගා කරන ලද උක් ශාක පත්‍ර නයිට්‍රජන් පරිමාණය අනාවැකි සඳහා ඩ්‍රෝන් පින්තූර භාවිතය. නිවර්තන කෘෂිකාර්මික පර්යේෂණ, 35(1): පි. 11–23. [https://doi.org/10.4038/tar.v35i1.8700]
- කුමාරසිරි, යූ.ඩබ්ලිව්.එල්.එම්., කුලසේකර, බී.ආර්., තාරිකා, ටී., සහ ගුණතිලක, සී. (2024). ඩ්‍රෝන් සහ යන්ත්‍ර ඉගෙනුම් ක්‍රම භාවිතයෙන් උක් ඵලදායීතාවය සහ Brix අගය අනාවැකිය. ස්ථායී සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාල-කාර්මික සහයෝගිතා පිළිබඳ පළමු ජාත්‍යන්තර සම්මේලනය – 2024, කොළඹ, ශ්‍රී ලංකාව.
- තුෂාරි, ඒ.එන්.ඩබ්ලිව්.එස්. සහ ඩි කොස්තා, ඩී.එම්. (2024). කළු දුඹුලු රෝග -ප්‍රතිරෝධී උක් ප්‍රභේද තෝරා ගැනීම සඳහා රූප විද්‍යාත්මක සහ ජෙව රසායනික දර්ශක තීරණය කිරීම. බෝග වැඩිදියුණු කිරීමේ සඟරාව, 38(2), 73-94. https://doi.org/10.1080/15427528.2023.2284163
- තුෂාරි, ඒ. එන්.ඩබ්ලිව්. එස්. සහ රාඹ, ජී. පී. (2024). ශ්‍රී ලංකාවේ සුදු පත්ර රෝග කළමනාකරණය සඳහා නව්‍ය උපාය මාර්ග පිළිබඳ වැඩමුළුව. ශාක රෝගකාරක මොලිකියුට්, 14(1), 58-60.
- විමලසිරි, එච්. සී. කේ., කීර්තිසිංහ, ජේ. පී., වනසිංහ, වී. කේ. ඒ. එස්. එම්. සහ වංචලා, කේ. එම්. ජී. (2024). උක් සුදු පත්ර රෝග වාහක ඩෙල්ටොසෙෆලස් මෙනෝනි (හෙමිප්ටෙරා: සිකැඩෙලිඩේ) සඳහා විකර්ෂක ලෙස ඵලදායී ශාක සාර භාවිතය. Agrica, 13(S), 275-284. DOI: 10.5958/2394-448X.2024.00036.1
- දිසානායක, ඩී. ඒ. එන්. එස්., අරුග්ගොඩ, ඒ. ජී. බී. සහ වංචලා, කේ. එම්. ජී. (2024). වගාවේ කඳන් විදින පනුවා (කයිලෝ සැකරිෆැගස්) සඳහා විකර්ෂක ලෙස සුදුසු ශාක සාරය හඳුනාගැනීම. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2024 (IRC-OUSL 2024).
- ගමගේ, ඩී. ජී. පී. ඩී., ගුණසේන, එම්. ඩී. කේ. එම්., පෙරේරා, ඒ. එම්. එම්. එස්., තුෂාරි, ඒ. එන්. ඩබ්ලිව්. එස්. සහ පෙරේරා, ජේ. කේ. යූ. ඩී. (2024). කැලස් භාවිතයෙන් සංවර්ධනය කරන ලද උක් (සැකරම් විශේෂ දෙමුහුන්) ගහනවල විකෘති විවල්‍යතාවය සහ රෝග ප්‍රතිරෝධය ඇගයීම. 5 වන ජාත්‍යන්තර කෘෂිකාර්මික විද්‍යා සමුළුවේ සම්මන්ත්‍රණ සංග්‍රහය, ශ්‍රී ලංකාව, බෙලිහුල්ඔය, 8.

- වනසිංහ, වී. කේ. ඒ. එස්. එම්., චංචලා, කේ. එම්. ජී., හේමචන්ද්‍ර, කේ. එස්., නුගලියද්දේ, එල්. සහ කුමාර, ඒ. ඩී. එන්. ටී. (2024). ශ්‍රී ලංකාවේ කඳන් විදින පනුවා, කයිලෝ සැකරිෆැගස් ඉන්ඩිකස් (ලෙපිඩොප්ටෙරා: ක්‍රැම්බිඩේ) ට එරෙහිව වල් උක් (එරියන්තස් විශේෂ) පරීක්ෂා කිරීම. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ 36 වන සමුළුවේ සම්මන්ත්‍රණ සංග්‍රහය, 7.
- වනසිංහ, වී. කේ. ඒ. එස්. එම්., චංචලා, කේ. එම්. ජී., හේමචන්ද්‍ර, කේ. එස්., නුගලියද්දේ, එල්. සහ කුමාර, ඒ. ඩී. එන්. ටී. (2024). ශ්‍රී ලංකාවේ කඳන් විදින පනුවා, (කයිලෝ සැකරිෆැගස් ඉන්ඩිකස්, ලෙපිඩොප්ටෙරා: ක්‍රැම්බිඩේ) ආසාදනය සඳහා උක් සහ එරියන්තස් කොළ කොපුවේ රූප විද්‍යාවේ බලපෑම. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ 36 වන වාර්ෂික සමුළුවේ සම්මන්ත්‍රණ සංග්‍රහය, 9.
- කවිතානි, එන්.ජී.එච්.අයි., වික්‍රමසිංහ, අයි. සහ මාරලන්ද, එස්.එම්.ටී.ඒ. (2024). කෙන්ද්‍රාපසරණය නොකරන ලද සීනි ආදේශ කිරීම මගින් රසකැවිලි නිෂ්පාදනවල භෞතික-රසායනික ගුණ, ප්‍රතිසටියක සහ ෆිනෝලික අන්තර්ගතය බලපෑම. ආහාර රසායනයේ ප්‍රගතිය, 4, පිටු.100604.
- අජිත් කුමාර්, එස්., මාරලන්ද, එස්.එම්.ටී.ඒ., සහ සින්තුජා, එල්.පී. (2024). කුඩා පරිමාණ හකුරු නිෂ්පාදනය සඳහා ඉන්ධන ලෙස භාවිත කළ හැකි බෑගස් අන්තර්ගත බ්‍රිකට් සහ පෙලට් සංවර්ධනය. ජෑන්නා සංසදය සමාලෝචන වාර්තාව, පරිච්ඡේද 30, පිටු.10.
- ජයවර්ධන, එස්.පී., මාරලන්ද, එස්.එම්.ටී.ඒ., සහ සින්තුජා, එල්.පී. (2024). මින්ට් සහ නිල් කටරොලු මල් සාරය සමග අගය එකතු කරන ලද සීනි වැඩි දියුණු කිරීම. ජෑන්නා සංසදය සමාලෝචන වාර්තාව, පරිච්ඡේද 30, පිටු.11.
- මිරුණාධරනි, එස්., මාරලන්ද, එස්.එම්.ටී.ඒ ., සින්තුජා, එල්.ඒ., සහ සුධර්ෂන්, එස්. (2024). උක් හකුරු නිශ්පාදනය සඳහා උක් යුශ වල පසු අස්වනු ගුනාත්මක භාවයෙ බලපෑම අද්යනය. *තාක්ෂණික ප්‍රගති සහ නවෝත්පාදන පිළිබඳ දෙවන සම්මන්ත්‍රණය: ආර්ථික ඵලදායීතාව සඳහා නව තාක්ෂණයන් යොදාගැනීම*, පරිච්ඡේද 2, පිටු.124–128.
- සුධර්ෂන්, එස්., මාරලන්ද, එස්.එම්.ටී.ඒ., සින්තුජා, පී. සහ මිරුණාධරනි, එස්. (2024). උක් හකුරු සුරක්ෂිත කාලය දිගු කිරීමට ආහාරයට ගත හැකි ආවරණ සහ ඇසුරුම්කරණයේ බලපෑම අද්යනය කිරීම. *තාක්ෂණික ප්‍රගති සහ නවෝත්පාදන පිළිබඳ දෙවන සම්මන්ත්‍රණය: ආර්ථික ඵලදායීතාව සඳහා නව තාක්ෂණයන් යොදාගැනීම*, පරිච්ඡේද 2, පිටු.112–114.
